## සහතික පත්‍ර නිකුත් කිරීම

---

### අලුතින් හැඳුනුම්පතක් ලබා ගැනීම සඳහා අවශ්‍ය ලියකියවිලි

---

1. සම්පූර්ණ කරන ලද පු.ලි.දෙ.වි. 1 හැඳුනුම්පත් අයදුම් පත්‍රය ග්‍රාම නිලධාරී විසින් සහතික කර තිබිය යුතුය.
2. වයස අවු 15 සම්පූර්ණ කරන ලද අයදුම්කරුවෙකු විය යුතුය.
3. රු 3.00 ක වටිනාකමින් යුත් මුද්දරයක් අලවා තිබිය යුතුය.
4. උප්පැන්න සහතිකය ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද ඡායා පිටපතක් අමුණා තිබිය යුතුය.
5. අවු 17ට වැඩි අයදුම් කරුවන් ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද ප්‍රමාදයට හේතු ප්‍රකාශය හා ඊට අදාල. රු250.00 දඩ මුදල ගෙවා එහි රිසිට්පත ඉදිරිපත් කළ යුතුය.
6. ICAO ප්‍රමිතියට අනුව ඡායාරූප 3ක්.
7. අවු 40ට අඩු අයදුම් කරුවෙකුට උප්පැන්න සහතිකය නොමැති නම් අනුමාන වයස් සහතිකයක් හෝ කල් ගිය උපතක් ලෙස උපත ලියා පදිංචි කර එම සහතිකය හෝ ඉදිරිපත් කළ යුතුය.
8. අවු 40ට වැඩි අයදුම්කරුවෙකුට උප්පැන්න සහතිකය නොමැති නම් හිස් ප්‍රතිඵල ලේඛනය උපත සනාථ කළ හැකි දරුවන්ගේ උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතුය.

---

### නැතිවූ හැඳුනුම් පතක් ලබා ගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු තියකියවිලි.

---

1. නිසි ලෙස පුරවන ලද අයදුම්පත්‍රය.
2. හැඳුනුම්පත නැතිවීම සම්බන්ධයෙන් පොලීසියට පැමිණිල්ලක් කර ලබාගත් පොලිස් වාර්තාව (මාස 6 ක් නොයික්මවූ වාර්තාවක් විය යුතුය)
3. රු 15ක මුද්දරයක් අයදුම්පතෙහි අලවා තිබිය යුතුය.
4. උප්පැන්න සහතිකය ග්‍රාම නිලධාරි සහතික කර තිබිය යුතුය.
5. අවු 40ට වැඩි අයදුම්කරුවෙක් නම් උප්පැන්න සහතිකය නොමැති නම් හිස් ප්‍රතිඵල ලේඛනය හා උපන් දිනය සනාථ කළ හැකි දරුවන්ගේ උප්පැන්න සහතිකය අවශ්‍ය වේ.
6. අවු 40ට අඩු අයදුම් කරුවෙකුට උප්පැන්න සහතිකය නොමැති නම් අනුමාන වයස් සහතිකය හෝ
7. කල්ගිය උපතක් ලෙස උපත ලියාපදිංචි කර එම සහතිකය අවශ්‍ය වේ.

8. නැති වූ හැඳුනුම්පත් අංකය හා හැඳුනුම්පත භාවිතා කළ බවට ලිඛිත සාක්ෂි අවශ්‍ය වේ (උදා:විදේශ ගමන් බල පත්‍රය,රියදුරු බල පත්‍රය,බැංකු පොත් ආදියෙහි සහතික කළ ඡායා පිටපතක්)
9. ICAO ප්‍රමිතියේ ඡායාරූප 3 ක්.
10. තනතුර සඳහන් කරන්නනේ නම් එය සනාථ කිරීමට මාස 6 ක් ඇතුළත ලබා ගත් සේවා සහතිකයක් අවශ්‍ය වේ.
11. විවාහයෙන් පසු නම භාවිතා කරන්නේ නම් විවාහ සහතිකය අවශ්‍ය වේ.

---

**සංශෝධන හැඳුනුම් පත් ලබා ගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු ලියකියවිලි.**

---

1. සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය ග්‍රාම නිලධාරී විසින් සහතික කර තිබිය යුතුය.
2. ICAO ප්‍රමිතයේ ඡායාරූප 3 ක් .
3. අයදුම්පතෙහි රු 15ක මුද්දරයක් අලවා තිබිය යුතුය.
4. පරණ හැඳුනුම්පත.
5. උප්පැන්න සහතිකයේ සහතික කල ඡායා පිටපතක් .අවු40ට අඩු අයදුම් කරුවෙකුට උප්පැන්න සහතිකය නොමැති නම් අනුමාන වයස් සහතිකය හෝ කල්ගිය උපතක් ලෙස ලියාපදිංචි කළ සහතිකය අවශ්‍ය වේ අවු 40 වැඩි ආයදුම් කරුවෙකුට උප්පැන්න සහතිකය නොමැති නම් හිස් ප්‍රතිඵල ලේඛනය හා උපත සනාථ කළ හැකි ලියකියවිලි අවශ්‍ය වේ.
6. විවාහායන් පසු නම භාවිතා කරන්නේ නම් විවාහ සහතිකය අවශ්‍ය වේ.
7. ජාතික හැඳුනුම්පතේ හැඳුනුම්පත් අංකය නොපෙනේ නම් එම අංකය ඇතුලත් ලියවිල්ලක්( විදේශ ගමන් බලපත්‍රය,රියදුරු බලපත්‍රය,බැංකු පාස් පොත ආදිය)

- ජාතික හැඳුනුම්පත් එක් දින සේවා සඳහා යොමු කිරිමේ දී අයදුම්කරුට සහභාගි නොවී සිටිය හැකි අතර ඒ වෙනුවට ඔහුගේ/ඇයගේ පවුලේ සාමාජියෙකුට (මව,පියා,සහෝදරයා,සහෝදරිය,සැමියා,බිරිඳ,දරුවන්)පැමිණිය හැකි අතර ඔවුන් විසින් බලය පැවරිමේ අයදුම්පත්‍රය ග්‍රාම නිලධාරි මඟින් අත්සන් කර ගත යුතුය.